# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

නිවාඩු කාලීන පැවරුම්

සැකසුම-මාවනැල්ල අධ්‍යාපන කලාපය

# 2 ශ්‍රේණිය - පරිසරය( දෙසැම්බර්-3 සතිය)

## 16 තේමාව - අපේ උදවු ඕනෑ අය

දුවේ පුතේ අප වෙනත් කෙනකුගේ උදවු ලබා ගැනීමේදී,

- කාරුණික වචන භාවිතයට හුරුවෙන්න ඔනෑ
- යහපත්ව හැසිරෙන්න ඕනෑ
- ලබාදුන් උදවුව අගය කරන්න ඕනෑ
- ලබා දුන් උදවුවට ස්තූති කරන්නත් ඕනෑ

චුටි දුවේ පුතේ දැන් අපි වැඩිහිටියන්ගේ ද උදවු ඇතිව පහත කවි පන්තිය රඟ දක්වමින් ගායනා කරමු.

| | |
|---|---|
| අසරණ වූ තැනැත්තෙක් | දවස් හතක් බඩගින්නේ<br>කන්න මොකුත් නෑ ලැබුනේ<br>තොල කට වේළිලා මගේ<br>වතුර පොදක් වත් දෙන්නේ |
| ළමයා | අනේ අම්මේ අර සීයා<br>දවස් හතක් හාමතේ ලු<br>කන්න මොනවා හරි දීලා<br>කුසගිනි අපි නිවා දමමු |
| අම්මා | ඒක හරිම හොඳ දෙයක්<br>ලැබෙයි ඔබට ලොකු පිනක්<br>මේ බත් කන්නට දීලා<br>උදවු කරන එක හොඳක් |
| ළමයා | මෙන්න සීයෙ බත් ටිකක්<br>කාල ඉන්නකෝ ටිකක් |
| අසරණ වූ තැනැත්තා | අනේ දරුවෝ පින් සිදුවෙයි<br>කුස ගින්දර මෙයින් නිවෙයි<br>ලැබෙයි ඔබට ලොකු පිනක්<br>මේ බත් කන්නට දීලා |

E nanapiyasa 2 ශ්‍රේණිය පරිසරය -16 තේමාවට අදාල වීඩියෝව නරඹන්න.